(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2(7).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2011 ජනවාරි මස 24 වැනි සඳුදා

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම් දීම

පා.121/'11

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රුවන් විජයවර්ධන මහතා

ගරු ආර්. යෝගරාජන් මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා

ගරු ඒ. ඩී. චම්පික ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා 2011 ජනවාරි මස 04 වැනි දින,

"අද වෙලා තිබෙන්නේ මේකයි. 2011 අප්‍රේල් 01 වැනිදා අපි පළාත් පාලන ආයතනවල අලුත් සභාවාරය කැඳවන්න ඕනෑ. ඒකට ඇත්තටම මාර්තු මාසයේ ඡන්දය තියන්න වෙනවා."

යැයි පැවසූ විට පළාත් පාලන ආයතනවල නව කාල සීමා 2011 අප්‍රේල් මස 01 වැනි දින ආරම්භ වීමට නියමිත හෙයින් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් 2011 මාර්තු මස පැවැත්වෙනු ඇති බව එතුමා සභාවට සහතික වූ හෙයින් ද;

කොළඹ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ දෙහිවල - ගල්කිස්ස මහනගර සභාවල හා කොලොන්නාව නගර සභාවේ ඡන්ද විමසීම් දැන් කල්දමනු ලැබ ඇති හෙයින් හා තවත් මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල ඡන්දද කල් දමනු ලැබීමට නියමිත බව වාර්තා වී ඇති හෙයින් ද; හා

අමාත්‍යවරයා උවමනාවෙන්ම අසත්‍ය ප්‍රකාශයක් කරමින් සභාව නොමග හැරිය හෙයින් ද;

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යවරයා ලෙස සිය කාර්යයන් ඉටුකිරීම තවදුරටත් කරගෙන යාමට අමාත්‍යවරයා සතු හැකියාව කෙරෙහි සභාවේ විශ්වාසය ගිලිහී ඇති බවට හා අමාත්‍ය මණ්ඩලයේ ධුරයක් හෙබවීම සඳහා ඔහු තවදුරටත් සුදුසු හා යෝග්‍ය තැනැත්තෙකු නොවන බවට මෙම සභාව යෝජනා කරයි.